# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1772/5 - 2012 අගෝස්තු මස 21 වැනි අඟහරුවාදා - 2012.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78 VIII

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20 වැනි වගන්තියේ (4) උපවගන්තියේ (අ) ජේදය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20 වැනි වගන්තියේ (4) උපවගන්තියේ (අ) ජේදය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මා විසින් මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් වන උසස් අධ්‍යාපන ආයතනවල සහ ඒවාට අනුයුක්ත කොට ඇති උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනවල වැඩ කටයුතු සහ පරිපාලනය දිගටම පවතින වර්ජනය හේතු කොට ගෙන බරපතල ලෙස අවුල් වී ඇති බවට උසස් අධ්‍යාපන ආයතනවල සහ ඒවාට අනුයුක්ත කොට ඇති උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනවල අදාළ බලධාරීන්ගෙන් විමසීමෙන් අනතුරුව ඒ පිළිබඳව සෑහීමකට පත්වීමෙන් පසු මේ නියමය මගින් මේ උපලේඛනයේ සඳහන් ඒ උසස් අධ්‍යාපන ආයතන සහ ඒවාට අනුයුක්ත කොට ඇති උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතන 2012 අගෝස්තු මස 21 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නැවත දැනුම් දෙන තුරු අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් වසා දැමීමට නියම කරමි.

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2012 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ දීය.

**උපලේඛනය**

වෛද්‍ය පීඨය හැර කොළඹ විශ්වවිද්‍යාලය
වෛද්‍ය පීඨය හැර පේරාදෙණිය විශ්වවිද්‍යාලය
වෛද්‍ය පීඨය හැර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
වෛද්‍ය පීඨය හැර කැළණිය විශ්වවිද්‍යාලය
මොරටුව විශ්වවිද්‍යාලය
වෛද්‍ය විද්‍යා පීඨය හැර යාපනය විශ්වවිද්‍යාලය

1A - G 16468— 840 (2012/8)

වෛද්‍ය පීඨය හැර රුහුණු විශ්වවිද්‍යාලය
සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය හැර ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය
වෛද්‍ය සහ සමාන්තර විද්‍යා පීඨය හැර ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
දේශීය වෛද්‍ය විද්‍යායතනය
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය
ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යාපන ආයතනය
මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය
තාක්ෂණ විද්‍යා ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය
ශ්‍රීපාලි මණ්ඩපය
ත්‍රිකුණාමල මණ්ඩපය
වවුනියා මණ්ඩපය.

09-53

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.